# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
# (කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**04. දත්ත පරිපාලක තනතුරු - 01**

A. **බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -:**

I. තොරතුරු තාක්ෂණය විෂය ක්ෂේත්‍රයෙන් ලබාගත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධිය

B. **අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -:**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**වයස් සීමාව** - : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -:** 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA - 3 2016 - රු. 32,200.00 – 10x445 – 11x660 - 10x730 - 5x750 – 54,960.00 ක් වේ.

**බඳවා ගැනීමේ දී වැටුප් තලය -:** රු. 32,200.00 වේ.

**වෙනත් දීමනා -:** රජය මඟින් අනුමත දීමනා හා පහසුකම් හිමි වේ.

මෙම තනතුරු ස්ථිර ය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමි වේ. වසර තුනක පරිවාස කාලයකින් පසු ස්ථිර කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තනතුර සඳහා බඳවාගනු ලැබේ.

ඔබගේ අයදුම්පත්‍රය **"සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත 2023.12.13 දිනට පෙර ගෙනවිත් බාරදීම කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මඟින් අයදුම් කළ යුතුයි. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. වැඩිදුර තොරතුරු www.ssb.gov.lk වෙබ් අඩවිය තුළින් ලබාගත හැක.

**සභාපති,**
**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය,**
**"සමාජ ආරක්ෂණ පියස",**
**අංක 18, රාජගිරිය පාර,**
**රාජගිරිය.**
**2023.11.29**